# විද්‍යාලංකාර ප්‍රකාශය හා භික්ෂුවගේ උරුමය

විද්‍යාලංකාර පිරිවෙන්හි ආචාර්ය මණ්ඩලය විසින් ඒකච්ඡන්දයෙන් විද්‍යාලංකාර ප්‍රකාශය සම්මත කෙරී ඇත්තේ 1946 පෙබරවාරි මස 13 වැනි දින ය. ඉන් මාස කිහිපයකට පසුව පූජ්‍ය වල්පොළ රාහුල හිමිපාණන් වහන්සේ විසින් රචිත භික්ෂුවගේ උරුමය නම් පොත ප්‍රසිද්ධ කෙරිණි. විද්‍යාලංකාර ප්‍රකාශයෙන් අවුරුදු පනස්අටකට පසුව භික්ෂූන් වහන්සේලා පිරිසක් පාර්ලිමේන්තුවට වැඩම කිරීමට ලැයිස්තුගතව නාමයෝජනා පත්‍ර භාරදුන්හ. 1994 පොදු ජන එක්සත් පෙරමුණ හා 2004 එක්සත් ජනතා නිදහස් සංධානය අතර වෙනසක් ඇතිවාක් මෙන්ම විද්‍යාලංකාර ප්‍රකාශය හා නාම යෝජනා ප්‍රකාශය අතර ද වෙනසක් වෙයි. මේ වෙනස කුමක් දැයි අවබෝධ කරගැනීම ඉතා වැදගත් වෙයි.

1946 දී මෙරට තිබූ දේශපාලන පක්ෂ වූයේ ලංකා සමසමාජ පක්ෂය හා ලංකා කොමියුනිස්ට් පක්ෂය ය. ගුණසිංහ මහතාගේ කම්කරු පක්ෂය යම් යම් සීමා තිබූ පක්ෂයක් විය. එක්සත් ජාතික පක්ෂය බිහිවූයේ ඉන් ටික කලකට පසුව ය. එසේ වුවත් එ ජා පක්ෂයේ මුල (ප්‍රොටෝ) පක්ෂ එකල ද දැකගත හැකි විය. ලංකා සමසමාජ පක්ෂය අධිරාජ්‍ය විරෝධී දේශපාලන පක්ෂයක් විය. කොමියුනිස්ට් පක්ෂය සෝවියට් දේශය අනුව යමින් යුද්ධය සඳහා පෙනී සිටියේ ය. අද යුද්ධයට ඉතා වියුක්තව විරුද්ධවන කොමියුනිස්ට්වාදීන්ට එදා තමන් ෆැසිස්ට්වාදයට විරුද්ධව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය සමග එක්වී යුද්ධ කළ බව අමතක ය. කෙසේ වුවත් ජාතිකවාදී මතයක සිටි භික්ෂූන් වහන්සේ මෙන් ම ගුරුවරු හා වෙද මහතුන් ද යම් පිරිසක් එදා ප්‍රධාන වශයෙන් සමසමාජ පක්ෂයට හා කොමියුනිස්ට් පක්ෂයට සහාය දුන්හ. මේ අය ජාතික මතවාදීන් වුව ද මාක්ස්වාදී පක්ෂවල මූලික කාර්යභාරය අප වැනි රටවල ජාතිකත්වය නැති කිරීම වුව ද වෙනත් ජාතික පක්ෂයක් නොමැති වීම හේතුවෙන් මාක්ස්වාදී පක්ෂවල වූ අධිරාජ්‍ය විරෝධය හේතුකොටගෙන ඒ පක්ෂවලට සහාය දුන්හ. ජාතික මතවාදයේ අධිරාජ්‍ය විරෝධී බව හා මාක්ස්වාදී පක්ෂවල අධිරාජ්‍ය විරෝධී බව මතුපිටින් ගත්කල සමපාතී විය. මාක්ස්වාදය දේශපාලනයේ දී අධිරාජ්‍ය විරෝධී වුව ද සංස්කෘතියේ දී අධිරාජ්‍ය ගැති විය. කාල් මාක්ස් යනු සංස්කෘතික යටත්විජිතවාදියෙක් විය. 1946 දී ජාතික මතවාදීන්ට මේ පිළිබඳ අවබෝධයක් නොවී ය. ඒ දැනුම ජාතික මතවාදීන් ලබාගත්තේ අනූවේ දශකය මුල දී ය. එ ජා පක්ෂය හා එහි මූල පක්ෂ විජාතික බලවේගවල පක්ෂ විය. මාක්ස්වාදී පක්ෂවල ඇති විජාතිකත්වය පෙනී යන්නේ තරමක් කල්ගත වීමෙන් පසුව ය. එකල නිදහස් අධ්‍යාපන පණත රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සම්මත වූ කාලය ද විය. විද්‍යාලංකාර පිරිවෙන නිදහස් අධ්‍යාපන පණත සම්මත කර ගැනීම සඳහා කළ මෙහෙය අද කැලණිය විශ්ව විද්‍යාලයේ සිසුන්ගේ ද උරුමය විය යුතු නමුත් බොහෝ සිසුන් ඒ බවක් දන්නේ යැයි මම නොසිතමි. ඒ මෙහෙය දන්නා කිසිවකුවත් ධර්මාලෝක ශාලාව ලෙනින් ශාලාව යැයි නම් කිරීමට කටයුතු නොකරනු ඇත.

භික්ෂූන් වහන්සේ  මෙසේ ප්‍රගතිශීලි (ප්‍රගතිශීලි යන වචනය ද විද්‍යාලංකාර පිරිවෙනේ නිර්මාණයකි) කාර්යවල  යෙදීම ම විජාතික බලවේගවලට හිස රදයක් විය. ඔවුහු ඊනියා භික්ෂු දේශපාලනයට විරුද්ධ වූහ. විද්‍යාලංකාර ප්‍රකාශය නිකුත්වූයේ ද භික්ෂුවගේ උරුමය පොත ප්‍රකාශයට පත්වූයේ ද එවැනි පසුබිමක ය. එමගින් භික්ෂූන් වහන්සේ දේශපාලන ක්‍රියාවල යෙදීම අනුමත කෙරිනි. මෙරට මෑත යුගයේ භික්ෂු දේශපාලනය අරුත්ගන්වනු ලැබුයේ විද්‍යාලංකාර ප්‍රකාශය මගිනි. එබැවින් ම එච්. එල්. සෙනෙවිරත්න වැනි අය භික්ෂු දේශපාලනයක් ගැන කතා කරමින් තම පොත්වලින් විද්‍යාලංකාර ප්‍රකාශය ද භික්ෂූන් වහන්සේ ජාතික දේශපාලනයෙහි යෙදීමද විවේචනය කරති. එහෙත් ඔවුහු බද්දේගම සමිත හිමිට දේශපාලනය අහිමි නොකරති.

1946 දී භික්ෂූන් වහන්සේ යම් ආකාරයක දේශපාලනයක නිරතවීම ගැන විරුද්ධ වූවෝ විජාතික බලවේගවල නියෝජිතයෝ වූහ. එයට ප්‍රධාන වශයෙන් ම පක්ෂ වූයේ ජාතික මතවාදවල සිටි අය ය. එයට අමතර ව මාක්ස්වාදීහු ද භික්ෂු දේශපාලනයට පක්ෂ වූහ. ඒ ජාතිකත්වයක සිට නොව භික්ෂූන් වහන්සේ ද තවත් පුද්ගලයකු ලෙස සලකමිනි. ජාතිකත්ව මත දැරූ අය භික්ෂූන් වහන්සේ දේශපාලනයෙහි යෙදීම යන්නෙන් අදහස් කෙළේ දේශපාලනඥයන්ට උඩින් සිටිමින් ඔවුන්ට අවවාද අනුශාසනා කරමින් පොදු වැඩවල නිරතවීම ය. ඔවුහු භික්ෂූන් වහන්සේ දේශපාලනඥයන් බවට පත්වියයුතු බවක් හෝ දේශපාලනඥයන් වෙනුවට ආදේශ වියයුතු බවක් හෝ නොකීහ. එහෙත් ඊනියා බුද්ධිවාදී හෙවත් හේතුවාදී බෞද්ධ සම්ප්‍රදාය විද්‍යාලංකාර ප්‍රකාශය විසින් අනුමත කෙරුණු භික්ෂු දේශපාලනය ද දැක්කේ හා දකින්නේ භික්ෂූන් වහන්සේ දේශපාලනඥයන් බවට පත්වීම යන අර්ථයෙන් ය. (ඊනියා ජාත්‍යන්තර බෞද්ධ හෝ ඊනියා

© Prof. Nalin De Silva

බෞද්ධ සම්ප්‍රදාය - මෙවැනි සම්ප්‍රදායක් ඇත්තේ ඕල්කට් බෞද්ධයන්ගේ මනසෙහි සහ බටහිර සමාජ විද්‍යාඥයන්ගේ පොතපතෙහි සහ බටහිර රටවල ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ඉපිද බෞද්ධ වූ අයගේ මනසෙහි ය. මොවුන්ට භික්ෂූන් වහන්සේ යනු ලෝකයෙන් ඈත් වී නිවන් දැකීම සඳහා මහණදම් පුරන පිරිසකි. මේ ආකල්පය සිංහල බුද්ධාගමට පමණක් නොව, පොදුජනයාගේ හිතසුව පිණිස සැරිසරන ලෙසට බුදු රජාණන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේට දෙන ලද උපදෙසට ද පටහැණි ය.) මේ අතර මාක්ස්වාදී පිරිස භික්ෂු දේශපාලනය දුටුවේ භික්ෂූන් වහන්සේට ද පුරවැසියන් ලෙස දේශපාලනයෙහි යෙදීමට අයිතියක් ඇත යන අර්ථයෙනි. සමිත හිමි දේශපාලනය කරන්නේ මේ අර්ථයෙන් ය. විජාතික බලවේගවල සිටි සිංහලයෝ ද ඕල්කට් බෞද්ධයෝ වූහ. එබැවින් ඔවුහු ද භික්ෂූන් වහන්සේ දේශපාලනඥයන්ට උඩින් සිට අවවාද අනුශාසනා කරමින් පොදු වැඩවල ද නිරත විය යුතු ය යන්නට විරුද්ධ වූහ. මේ පිරිසෙහි පසුව එ ජා ප නායකයන් බවට පත් වූ ඇතැම්හු විද්‍යාලංකාර පිරිවෙනේ භික්ෂූන් වහන්සේට දානය දීම වැළැක්වීමට පවා කටයුතු කළහ.

විද්‍යාලංකාර ප්‍රකාශයෙහි ප්‍රතිඵලය ලෙස සිංහල සමාජය කෝණ තුනකින් භික්ෂු දේශපාලනය දෙස බැලූහ. පසුව එ ජා පක්ෂයේ නායකයන් හා සාමාජිකයන් බවට පත් වූවෝ භික්ෂූන් වහන්සේ ආගමික කටයුත්තකින් බැහැර වූ කිසිම පොදු වැඩක නිරත වීමට විරුද්ධ වූහ. මාක්ස්වාදී අදහස් දැරූ ගිහියෝ භික්ෂූන් වහන්සේ තවත් පුද්ගලයන් ලෙස සලකමින් උන්වහන්සේ ඕනෑම දේශපාලනයක යෙදීම අනුමත කළහ. ඒ අනුව කටයුතු කළ ඇතැම් මාක්ස්වාදී අදහස් දැරූ භික්ෂූන් වහන්සේ දේශපාලන පක්ෂවල සාමාජිකත්වය ලැබූහ. සමිත හිමි මෙන් පිඬු සිඟා වැඩීම අමතක කර ඡන්දය සිඟා වැඩියෝ ද ඒ අතර වූහ. විද්‍යාලංකාර ප්‍රකාශය මෙන් ම භික්ෂු උරුමය පොත ද මේ අන්ත දෙකම බැහැර කළ බව සිංහල බෞද්ධ සම්ප්‍රදාය දත්තෝ දැන සිටියහ. සිංහල බෞද්ධ සම්ප්‍රදාය විසින් භික්ෂූන් වහන්සේට දේශපාලනය තහනම් නොකෙරිණි. එහෙත් එය විශේෂිත දේශපාලනයක් විය. සිංහල භික්ෂූන් වහන්සේට පොදු වැඩ අකැප නොවී ය. උන්වහන්සේ රජුන් තැනූහ. රජුන්ට උපදෙස් දුන්හ. එහෙත් රජ නොවූහ. වත්මන් සන්දර්භය තුළ නම් පාර්ලිමේන්තු, පළාත් සභා හෝ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු නොවූහ.

1946 දී භික්ෂූන් වහන්සේට කිසිම දේශපාලනයක් නුසුදුසු යැයි කී පිරිස් 2004 දී භික්ෂූන් වහන්සේ සැඳ (ඡන්දය) සිඟා වැඩීම අනුමත කරති. එදා විද්‍යාලංකාරයට දානය අහිමි කිරීමට කටයුතු කළ අයගෙන් දේශපාලන වශයෙන් පැවත එන වත්මන් එ ජා ප නායකයෝ හා සිංහල බෞද්ධ විරෝධී නැවත උපන් (බෝන් අගේන්) ක්‍රිස්තියානි ලේඛකයෝ භික්ෂූන් වහන්සේ සෘජු දේශපාලනයට මැදිහත් වීම ගැන ප්‍රසාදයෙන් ලියති. කතා කරති. පසුගිය දා එ ජා ප නායකයකු වූ බෞද්ධයකු නොවන ජයලත් ජයවර්ධන මහතා ඉරිදා දිවයින සමග කරන ලද සාකච්ඡාවක දී හාමුදුරුවරු සැඳ සිඟා වැඩීම අනුමත කර ඇත. එක්තරා පැරණි ඉරිදා ඉංගිරිසි පුවත්පතක නිල වශයෙන් කෙසේ වුවත්, කතුකම් කරන, සිංහල බෞද්ධයනට විරුද්ධ ව ලියන තැනැත්තෙක් ද සැඳ සිඟා වැඩීමට පක්ෂව ලියා තිබුණි. කතෝලික හෝ ක්‍රිස්තියානි පල්ලිය හෝ නිල වශයෙන් මේ ගැන කිසිවක් ප්‍රකාශ කරාවි යැයි සිතිය නොහැකි ය. එහෙත් ඔවුන්ගේ ස්ථාවරය කුමක් දැයි දැන ගැනීමට අංජනම් එළියක් අවශ්‍ය නොවේ. 1946 දී සහ අද භික්ෂු දේශපාලනය සම්බන්ධයෙන් විජාතික බලවේග දරණ ආකල්පවල වෙනසක් ඇත්තේ ඇයි ද යන්න තේරුම් ගැනීම අපහසු නොවේ. ඔවුන්ට අවශ්‍ය සැඳ සිඟා වඩින භික්ෂූන් වහන්සේට කැඳවත් නොදී අපකීර්තියට පත් කිරීමට ය.

සැඳ සිඟා වඩින ඇතැම් භික්ෂූන් වහන්සේට අනුව උන්වහන්සේ පාර්ලිමේන්තුවට තේරී පත්වීමෙන් පසු දේශපාලනය ශුද්ධකර සුදුසු ගිහියන් අතට එය පත් කරනු ඇත. එය එසේ වුව ද එය ද සිංහල බෞද්ධ සම්ප්‍රදාය තේරුම් නොගෙනීමෙන් කරන ප්‍රකාශයක් පමණකි. දේශපාලනය නොව සඟ සසුන ද ශුද්ධ කර ඇත්තේ රජවරුන් මිස භික්ෂූන් වහන්සේ නොවේ. මෙරට කතිකාවත් සංගායනා ආදිය පවත්වනු ලැබ් ඇත්තේ රජවරුන් විසින් මිස භික්ෂූන් වහන්සේ විසින් නොවේ. භික්ෂූන් වහන්සේ කර ඇත්තේ කතිකාවත් පැවැත්වීම ගැන රජුන්ට උපදෙස් දීම ය. අනෙක් අතට මේ භික්ෂූන් වහන්සේ පාර්ලිමේන්තුවට පත් වුවත් උන්වහන්සේ වෙනුවට වෙනත් අයකු නම් කිරීමේ බලය ඇත්තේ ගිහියකු වූ පක්ෂයේ ලේකම්වරයාට මිස භික්ෂූන් වහන්සේට නොවේ. මේ ලේකම්ලා 2000 මැතිවරණයෙන් පසු එක් මන්ත්‍රී ධුරයක් ලැබී හැසිරුණු ආකාරය දෙස බලන විට අනාගතයේ දී මන්ත්‍රී ධුරයක් ලැබුණහොත් හැසිරෙන ආකාරය පිළිබඳ ව අමුතුවෙන් කිවයුතු නොවේ. කෙසේ වෙතත් තමන් වහන්සේ වෙනුවට වෙනත් ඊනියා සුදුස්සකු යැවීම පිළිබඳ කෙරෙන ප්‍රකාශයෙහි වෙනත් දෙයක් ද ගැබ් වී ඇත. මේ කරන්නේ ජාතියේ සුබ සිද්ධිය සඳහා පක්ෂ පූජාවක් ද නැත්නම් භික්ෂූන් වහන්සේ කර පිටින් පාර්ලිමේන්තු යැමේ මගඩියක් ද? සෝම හාමුදුරුවන් අපවත් වීමෙන් පසුව ඇති

© Prof. Nalin De Silva

වී තිබෙන බෞද්ධ පිබිදීම ගසා කෑමේ අරමුණක් ඇති බැවින් දැනටමත් සෝම හාමුදුරුවන්ට අපහාසයක් ද කෙරී ඇත. රැලි බලමින් දේශපාලනය කරන රැල්ලේ පාවී බලයට එමට උත්සාහ දරන අවස්ථාවාදීන් නිසා විජාතික බලවේග විසින් මෙහෙයවෙන තරුණයෝ සෝම හාමුදුරුවන්ට අපහාස වන අන්දමින් ඊනියා රැල්ලට උන්වහන්සේගේ නම ද සම්බන්ධ කරති.

එහෙත් උන්වහන්සේ ද අපකීර්තියට පත්කර සිංහල ජාතික ව්‍යාපාරය ද පල්ලම් බැස්සවීමට විජාතික බලවේග කල්පනා කරන්නේ නම් එය ඔවුන් දකින දවල් සිහිනයක් පමණකි. ජාතික ව්‍යාපාරය රඳා පවතින්නේ භික්ෂූන් වහන්සේට ලැබෙන ඡන්ද ප්‍රමාණය මත නොවේ. සැඳ සිගා වඩින භික්ෂූන් වහන්සේ යනු සමස්ත භික්ෂූන් වහන්සේ නොවේ. සැඳ සිගාව පරාජය වීමෙන් එයට විරුද්ධ වූ භික්ෂූන් වහන්සේ ද ජාතික ව්‍යාපාරයෙහි ඉල්ලුම හා සැපයුම දේශපාලනය හා රැලි දේශපාලනය නොකරන අතිමහත් බහුතරය ද ජයග්‍රහණය කරන බව ද අප අමතක නොකළ යුතු ය. විජාතික බලවේග බලා සිටින්නේ සැඳ සිගා වඩින භික්ෂූන් වහන්සේ පරාජය වීමෙන් පසුව මෙරට භික්ෂූත්වයට හා ජාතිකත්වයට තැනක් නැතැයි කීමට බව පැහැදිලි ය. ඒ භික්ෂූන් වහන්සේ පරාජය වුව ද ජාතික ව්‍යාපාරයේ අතිමහත් බහුතරය ජයග්‍රහණය කරන බව අපි ඔවුන්ට කියමු. භික්ෂූන් වහන්සේගේ පරාජයෙන් උන්වහන්සේට ආශිර්වාද කරන විජාතික බලවේග ද පරාජය වන බව ද අපි ප්‍රකාශ කර සිටිමු.

මෙරට ජාතික ව්‍යාපාරයේ යෙදී සිටින පිරිසක් 1985 පමණ සිට දේශපාලනයේ සිදුවන්නේ කුමක් ද යන්න පිළිබඳ ව මනා අවබෝධයකින් සිටිති. විශේෂයෙන් ම 1992 සිට සිදුවන දේ ඔවුහු ඇතැම් විට කල් තබාම ප්‍රකාශ කිරීමට සමත් වූහ. චන්ද්‍රිකාගමනයෙන් පසුව දේශපාලනය තේරුම් ගත හැක්කේ ජාතිකත්වය ඔස්සේ ලෝකය බැලීමෙන් ය. මෙහි දී ශ්‍රී ල නි ප සම්බන්ධයෙන් අප කියා ඇති දේ නැවතත් සාරාංශයක් ලෙස හෝ ඉදිරිපත් කළ යුතු ය. 1955 දී ශ්‍රී ල නි ප සිංහලත්වයේ පක්ෂය බවට පත් වීමෙන් පසුව මාක්ස්වාදී පක්ෂවලට තිබූ තැන නැතිවීමට පටන්ගත්තේ ය. මෙරට කිසි දිනක ධනපති කම්කරු පංති දේශපාලනයක් සිදු වී නැත. මෙරට දේශපාලනය ජාතික විජාතික බලවේග අතර වූ සටන මැදිකරගෙන විකාශය වී ඇත. 1955 ට පෙර මාක්ස්වාදී පක්ෂවලට යම් බලයක් අත් වූයේ සඟ වෙද ගුරු ජාතික බලවේග යම් ප්‍රමාණයකට හෝ ඒ පක්ෂවල මතුපිට අධිරාජ්‍ය විරෝධී දේශපාලනයට (සංස්කෘතියෙන් ඒ පක්ෂ යටත්විජිතවාදී විය.) ආකර්ෂණය වීම නිසා ය. 1955 න් පසුව ඒ පිරිස් ද ශ්‍රී ල නි පක්ෂයට ඇදී ආහ. ඉන් පසු ඒ පක්ෂවලට පැවැත්මක් ඇති වූයේ ශ්‍රී ල නි ප සමග සංධානවලට එළඹීමෙන් පමණකි. 1955න් පසු හුදු මාක්ස්වාදී පක්ෂයකට මෙරට ජනතාව අතර පැවැත්මක් නැත. මාක්ස්වාදී පක්ෂ ශ්‍රී ල නි ප සමග ආණ්ඩුවලට ගිය අවස්ථාවල දී ඒ පක්ෂවලින් කැඩී කම්කරු පංතියේ සුපිරි විප්ලවවාදී පක්ෂ බිහි කිරීමට ගිය අය සුපිරි විහිළුකරුවෝ වූහ. කම්කරු දේශපාලනයක් මේ රටේ නොමැති බව මොවුන්ට නොතේරෙන්නේ ද ඔවුන් මාක්ස්වාදී අබිං කා ඇති බැවිනි. මාක්ස්වාදය යනු ඇතැමුන් ජාතිකත්වයට එරෙහි වූවන් බවට පත්කරන ඔවුන්ගේ සිහිය අවුල් කරන අබිං වර්ගයක් වෙයි.

1971 දී බිහි වූ ජනතා විමුක්ති පෙරමුණේ සම්භවය ලංකා කොමියුනිස්ට් පක්ෂයට හා චීන කොමියුනිස්ට් පක්ෂයට දිව යයි. චීන කොමියුනිස්ට් පක්ෂයෙහි මුල සිට ම ජාතිකවාදී බීජ තිබුණි. ජනතා විමුක්ති පෙරමුණ බිහි වූයේ ද මේ බීජ සමගිනි. එය මාක්ස්වාදය කතා කළ ද හරයෙන් මාක්ස්වාදී නොවී ය. දැනට මාස දෙකකට පමණ පෙර ද කිසිවකු ලංකා පුවත්පතෙහි ජනතා විමුක්ති පෙරමුණෙහි මාක්ස් ලෙනින්වාදී ස්ථාවරය ගැන උදම් අනා තිබුණි. එහෙත් එහි එවැනි හරයක් නැත. මොවුන් නොදන්නා කරුණක් නම් ලෙනින් මාක්ස්වාදය වෙනස් කළ බවත් ලෙනින්වාදය යනු මාක්ස්වාදය නොවන බවත් ය. ලෙනින්ගේ කම්කරුවා හා මාක්ස්ගේ කම්කරුවා යනු එක් අයකු නොව දෙදෙනෙකි. වැඩි විස්තර සඳහා මාක්ස්වාදයේ දරිද්‍රතාවය කියවන්න. ජ වි පෙරමුණෙහි ස්වභාවය අනුව ම එයට ශ්‍රී ල නි පක්ෂය සමග සන්ධාන ගත වීම ගැටළුවක් නොවේ. මේ පක්ෂ දෙකෙහි ද මහජන එක්සත් පෙරමුණෙහි ද ඇත්තෝ පනස්හයේ දරුවෝ වෙති. පනස්හයේ අවජාතක දරුවෝ ද වෙති. ඔවුහු පනස්හයේ දරුවන් යනුවෙන් පිරිසක් නැතැයි ආඩපලි කියමින් භික්ෂූන් වහන්සේ වැරදි දේශපාලනයකට යොමු කරති.

මෙරට අවිඥානික ව සිංහලත්වයක් සිංහල ජනතාවගේ සිත් සතන්වල වෙයි. සෝම හාමුදුරුවන්ගේ අපවත්වීම වැනි අවස්ථාවල මතුපිටට එන්නේ මේ අවිඥානික බලවේගය ය. එහෙත් මෙරට ඇති සංස්කෘතික හා වෙනත් යටත්විජිතවාද නිසා මේ බලවේගය මතුපිටට සවිඥානික ව නොඑයි. ජාතික ව්‍යාපාරයේ රැලි දේශපාලනය

© Prof. Nalin De Silva

නොකරන්නන්ට අවශ්‍ය වන්නේ මේ බලවේගය සවිඥානික වූවක් බවට පත්කිරීමට ය. එහි දී කළ යුතු ප්‍රධාන ම කාර්යය වනුයේ ඇතැම් දේශපාලන පක්ෂ සවිඥානික ව ජාතිකත්ව මතවාදයකට ගෙන ඒම ය. එය තරමක් වෙහෙස ගෙන කළ යුතු කාර්යයකි. ඒ සඳහා කෙටි මාවත් නැත. 1992 සිට ම මේ අරමුණින් කටයුතු කරන පිරිසක් මේ රටේ වෙයි. 1994 මැතිවරණයේ දී ඔවුන් විජාතික බලවේගවල ග්‍රහණයට මුළුමනින් ම නතුකර ගනු ලැබූ පොදු පෙරමුණට එරෙහිව මැතිවරණයට ඉදිරිපත් වූයේ ශ්‍රි ල නිප හැසිරවීමේ බලය තමන්ට දෙන ලෙස කියමිනි. ඒ අවස්ථාවේ දී පනස්හයේ අවජාතක දරුවෝ ජාතිය මළකඳක් යැයි කියමින් තම අවස්ථාවාදී දේශපාලනයෙහි නිරත වූහ. 2000 වන විට පොදු පෙරමුණේ විජාතික බලවේග සමග ජාතික බලවේග ද තරග කරන්නට විය. පොදු පෙරමුණේ බල තුලනය වෙනස් වීමත් සමග තවදුරටත් ඉන් පිට සිටීම ජාතික බලවේගවලට අවශ්‍ය නොවී ය. ම ඒ පෙ හා ජ වි පෙ යථාකාලයේ දී ශ්‍රී ල නි ප සමග සන්ධානගත වීමෙන් ඒ බව පෙන්නුම් කර ඇත. කළ යුත්තේ මේ සංධානයෙහි ජාතික බලවේග තවත් ශක්තිමත් කිරීම ය.

ඉන්දියාවේ භාරතීය ජනතා පක්ෂය පිහිටුවන ලද ආකාරයට මෙරට ද සිංහලත්වයේ පක්ෂයක් අමුතුවෙන් නිර්මාණය කළ හැකි නොවේ. ඉන්දියාවේ එවැනි පක්ෂයක් සඳහා ඉඩක් තිබුණි. කොංග්‍රස් පක්ෂය බටහිර ලිබරල් අච්චුවේ පක්ෂයකි. ඉන්දියාවේ භාරතීය ජනතා පක්ෂයකට ඉඩ තිබුණ ද ලංකාවේ එසේ නොවේ. ලංකාවේ ශ්‍රී ල නි ප සිංහලත්වයේ පක්ෂය වූයේ 1954 දී ය. එහි වත්මන් නායකත්වය විජාතික බලවේග විසින් නිර්මාණය කරනු ලැබූව ද පක්ෂය පීලි පන්නා ඇති වුව ද එය නැවත පීල්ලට ගත හැකි ය. ජාතික බලවේග කළ යුත්තේ ඒ කරුණ ය. දැනටමත් ජාතික බලවේග යම් ප්‍රමාණයකට එය කර ඇත. විජාතික බලවේගවලට ආධාර වන අන්දමින් බල ලෝභීව භික්ෂූන් වහන්සේ පිරිසක් ද මුලා කරමින් කටයුතු කරන්නෝ පනස්හයේ අවජාතක දරුවෝ වෙති. 1994 ජාතික බලවේග ඉතා දුර්වල වූ අවස්ථාවේ දී ඔවුහු තම අවස්ථාවාදය පෙන්නුම් කරමින් විජාතික බලවේගවල පූර්ණ ග්‍රහණයට එකල හසු වී සිටි පොදු පෙරමුණට ආධාර කළහ. මෙරට ජාතික බලවේග විද්‍යාලංකාර ප්‍රකාශය මත පදනම් වී කටයුතු කිරීමෙන් ජයග්‍රහණය කරනු ඇත.

© Prof. Nalin De Silva